# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1988 අංක 66 දරන
# ශ්‍රී ලංකා ජාතික විද්‍යා ඇකඩමිය
# (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1988 දෙසැම්බර් මස 17 වන දින.]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1988 දෙසැම්බර් මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

**මිළ : ශත 75 යි.** **තැපැල් ගාස්තුව : ශත 75 යි.**

# 1988 අංක 66 දරන ශ්‍රී ලංකා ජාතික විද්‍යා ඇකඩමිය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1988 දෙසැම්බර් මස 17 වන දින]

එල්. ඩී.—ඕ. 48/84

**ශ්‍රී ලංකා ජාතික විද්‍යා ඇකඩමිය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

"ශ්‍රී ලංකා ජාතික විද්‍යා ඇකඩමිය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන ඇකඩමියක් එහි අධිසාමාජිකයන් විසින් එකඟවන ලද රීතිවලට අනුකූලව ඒ ඇකඩමියට අදාළ සියළු කරුණු ඵලදායි ලෙස කර ගෙන යාමේ සහ ඉටු කිරීමේ කාර්යය සඳහා එක් දහස් නවසිය හැත්තෑහය වන වර්ෂයේදී පිහිටුවන ලද හෙයින් ද: පූර්විකාව.

එකී ඇකඩමිය පිහිටුවීම අරමුණු කොටගත් පරමාර්ථ සහ කරුණු ඒ ඇකඩමිය විසින් මෙතෙක් කල් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටුකර ඇති හෙයින් ද ඒ ඇකඩමිය සංස්ථාගත කිරීම සඳහා ඉල්ලුම් කර ඇති හෙයින් සහ ඒ ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින්ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1988 අංක 66 දරන ශ්‍රී ලංකා ජාතික විද්‍යා ඇකඩමිය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ආරම්භවන දින සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු 'ඇකඩමිය' යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ජාතික විද්‍යා ඇකඩමියේ දැනට අධිසාමාජිකයන්ව සිටින්නාවූද මෙහි උප ලේඛනයේ නම් සඳහන් වන්නාවූ ද තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවේ අධිසාමාජිකයන් ලෙස මින් මතු ඇතුළත් කර ගනු ලබන තැනැත්තන් "ශ්‍රී ලංකා ජාතික විද්‍යා ඇකඩමිය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් බවට පත්වන සහ පත්විය යුතු අතර, එකී සංස්ථාපිත නාමයෙන් ඒ සංස්ථාව විසින්ද ඊට විරුද්ධවද සියළු අධිකරණවලදී නඩු පවරනු ලැබිය හැකිය. තවද පොදු මුද්‍රාවක් තබා ගැනීමේද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේද බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේය. ශ්‍රී ලංකා ජාතික විද්‍යා ඇකඩමිය සංස්ථාගත කිරීම.

3. සංස්ථාව පිහිටුවීමට අරමුණු කොටගත් පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) විද්‍යාත්මක දැනුම වැඩිදියුණු කිරීම, නංවාලීම, ප්‍රකාශයට පත් කිරීම සහ පතුරුවා හැරීම;

(ආ) ශ්‍රී ලංකාවේ විද්‍යාත්මක ප්‍රයත්න සහ විද්‍යාත්මක සාධක පිළිබඳ ප්‍රමිති ඇති කිරීම සහ පවත්වා ගෙන යාම, විද්‍යාවේ ප්‍රගතිය සඳහා කරන ලද විශිෂ්ඨ සේවා උපහාරාත්මකව පිළි ගැනීම;

2—ඒ 071996—7,355 (88/08)

(ඈ) ආණ්ඩුවට උපදෙස් දීමේ ස්වාධීන උපදේශක මණ්ඩලයක් වශයෙන් ක්‍රියා කිරීම, අවශ්‍ය අවස්ථාවලදී පර්යේෂණ කටයුතු භාර ගැනීම සහ මෙහෙයවීම, ජාතික යහපත සඳහා විද්‍යාත්මක හා තාක්ෂණික සලකා බැලීම අතිශයින්ම අවශ්‍ය වන කරුණු සම්බන්ධයෙන් සැලකිල්ල දක්වීම සහ වාර්තා කිරීම, ජාතික සංවර්ධනයෙහි ලා විද්‍යාව හා තාක්ෂණය අදාළ කැරෙන ක්‍රියාකාරිත්ව සම්බන්ධයෙන් උපදෙස් දීම සහ ශ්‍රී ලංකාවේ සංවර්ධනය සඳහා ලෝ පතල විද්‍යාත්මක සාධක ප්‍රයෝජනයට ගැනීම සම්බන්ධයෙන් වාර්තා කිරීම ;

(ඇ) ජාතික සම්පත් අතුරින් යම් එක් සම්පතක් හෝ වෙනත් සම්පත් සහ පරිසරය සමස්තයක් වශයෙන් භාවිත කිරීමේ ප්‍රතිඵල සැලකිල්ලට ගනිමින් ජෛවගෝලය දීර්ඝ කාලීන ලෙස අඛණ්ඩව උපයෝගී කර ගැනීමට ගැළපෙන පරිදි උපරිම ඵලදායිත්වය සහතික වන අයුරු ජාතික සම්පත් පාලනය කිරීම හා පරිමේය ලෙස භාවිත කිරීම සම්බන්ධයෙන් වාර්තා කිරීම සහ ජාතික සංවර්ධනයෙහි ලා රටේ සම්පත් භාවිත කිරීමට උපකාරී වීම ;

(ඉ) විද්‍යාත්මක ලිපි ලේඛන ප්‍රසිද්ධ කිරීම, ඒවා නංවාලීම සහ පුස්තකාලයක් පවත්වා ගෙන යාම ;

(ඒ) දේශීය සහ විදේශීය විද්‍යා මණ්ඩල සහ ශ්‍රී ලාංකික විද්‍යාඥයන් අතර සම්බන්ධතා වර්ධනය කිරීම හා පවත්වා ගෙන යාම ; සහ

(උ) විද්‍යාව හා තාක්ෂණය වර්ධනය කිරීම සහ අවශ්‍ය යයි සලකනු ලබන අනෙකුත් කාර්ය සඳහා අරමුදල් හා පරිත්‍යාග මුදල් සපයා ගැනීම සහ පාලනය කිරීම.

4. (1) සංස්ථාවේ පරමාර්ථ මුදුන් පමුනුවා ගැනීම සඳහා අවශ්‍ය වන්නාවූ, හිතකර වන්නාවූ හෝ ආනුෂංගික වන්නාවූ, සියළු ක්‍රියා මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධි විධානවලට යටත්ව ඉටු කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය. සංස්ථාවේ පොදු පරමාර්ථ.

(2) (1) වන උපවගන්තියෙන් පැවරුණු බලතල වල ව්‍යාප්තියට හානියක් නොමැතිව පහත දැක්වෙන බලතල සහ කර්තව්‍ය සංස්ථාව සතු වේ :—

(අ) දේශීය හෝ විදේශීය ප්‍රභවයන්ගෙන් මුදලින් නැතහොත් අන්‍යාකාරයකින් ලැබෙන තෑගි, ප්‍රදානයන්, පරිත්‍යාග, ආධාර සහ සම්මාදම් භාරගැනීම හෝ එකතු කිරීම ;

(ආ) සංස්ථාවේ අභිවෘද්ධිය සඳහා හෝ සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා මිලට ගැනීමෙන්, හුවමාරුකර ගැනීමෙන්, තෑගි වශයෙන්, උරුම කර දීමෙන් හෝ රික්ත වරණය කිරීමෙන් හෝ වෙනත් යම් ආකාරයකින්, කවර වුවද වර්ගයක නැතහොත් ස්වභාවයක චංචල හෝ නිශ්චල දේපල අත්කර ගැනීම සහ ඒ දේපල සදාකාලිකව හෝ යම් අඩු කාල පරිච්ඡේදයක් සඳහා හෝ යම් ප්‍රකාශිත භාරයකට යටත්ව හෝ අන්‍යාකාරයකින් හෝ දැරීම හා භුක්ති විඳීම ;

(ඇ) බැංකු ගිණුම් විවෘත කිරීම, පවත්වාගෙන යාම සහ වැසීම සහ ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ සපයා ගැනීම ;

(ඈ) සංස්ථාවට අයත් හෝ සංස්ථාව විසින් දරනු ලබන චංචල හෝ නිශ්චල යම් දේපලක්, ඒ දේපලට අදාල යම් භාරයක් වේ නම් ඊට යටත්ව, විකිණීම, බදු දීම, උගස් කිරීම, හුවමාරු කිරීම, හෝ අන්‍යාකාරයකින් නියාදනය කිරීම ;

(ඉ) සංස්ථාව වෙත පවරා ඇති හෝ සංස්ථාවට අයත් හෝ අරමුදල් ප්‍රමාණවත් සුරැකුම්පත් වල ආයෝජනය කිරීම හෝ සංස්ථාවේ කාර්යය සඳහා සුදුසු හෝ අවශ්‍ය යැයි සලකනු ලබන ඉඩම්, ගොඩනැගිලි, බඩු මුට්ටු හෝ වෙනත් දේපල මිලට ගැනීම සඳහා නැතහොත් අත්කර ගැනීම සඳහා ආයෝජනය කිරීම ; සහ

(ඊ) සංස්ථාවට අයත් හෝ සංස්ථාව විසින් දරණු ලබන යම් ඉඩමක යම් ගොඩනැගිල්ලක් හෝ නිර්මාණයක් ඉදි කිරීම හෝ ඉදි කිරීමට සැලැස්වීම.

5. (1) සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා සහ එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති, සංස්ථාව විසින්, කලින් කල තත්කාර්යය සඳහා විශේෂයෙන් කැඳවනු ලබන රැස්වීමකදී ඊට පැමිණ ඡන්දය දෙන අධි සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් සාදනු ලැබිය හැකිය. සංස්ථාවේ රීති.

(2) ඉහත සඳහන් ඡේදයෙන් පවරා ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව විශේෂයෙන්ම පහත දැක්වෙන කරුණු සියල්ලම හෝ ඒවායින් කිසිවක් හෝ සම්බන්ධයෙන් විධි විධාන ඒ රීති මගින් සැලැස්විය හැකිය :—

(අ) සංස්ථාවට අධි සාමාජිකයන් ඇතුලත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම සහ ඔවුන් නෙරපීම ;

(ආ) සංස්ථාවේ රැස්වීම් කැඳවීමේදී සහ ඒ රැස්වීම්වල කටයුතු කිරීමේදී අනුගමනය කළයුතු ක්‍රියා පරිපාටිය ; සහ

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ කාර්ය සහ කර්තව්‍ය ඔවුන් විසින් ඉටු කිරීම.

3 ඒ—71996 (83/08)

(3) සංස්ථාවේ යම් රීතියක්, (1) වන උප වගන්තිය යටතේ රීතියක් සාදනු ලැබිය හැකි ආකාරයෙන්ම, සංශෝධනය කිරීම හෝ ඊට යමක් එකතු කිරීම හෝ ඒවා පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකිය.

(4) සංස්ථාවේ සියලු අධිසාමාජිකයෝ සංස්ථාවේ තත්කාලයේ වලංගුව බලපවත්නා රීති වලට යටත් විය යුත්තාහ.

**ඇකඩමියට අයවිය යුතු සහ ඇකඩමිය විසින් ගෙවිය යුතු ණය.**

6. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන අවස්ථාවේදී ඇකඩමියේ පැවති සියලු ණය සහ බැරකම් මේ පනතේ කාර්යය සඳහා මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, ඇකඩමියට අය විය යුතු සියලු ණය සහ ගෙවිය යුතු සියලු දායක මුදල් සංස්ථාව වෙත ගෙවනු ලැබිය යුතුය.

**සංස්ථාවේ මුද්‍රාව.**

7. සංස්ථාවේ අවසරය ඇතිව මිස සහ යටත් පිරිසෙයින් සංස්ථාවේ අධි සාමාජිකයන් දෙදෙනෙකු ඉදිරියේදී හැර, සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, ඒ අධි සාමාජිකයන් දෙදෙනා තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඒ සාධන පත්‍රයට තම අත්සන යෙදිය යුතුය. ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන කිරීමට පරිබාහිරව විය යුතුය.

**සංස්ථාවේ අධිසාමාජිකයින්ගේ වගකීම සීමා කිරීම.**

8. සංස්ථාවේ ණය සහ බැරකම් ගෙවා නිදහස් කිරීමේ කාර්යය සඳහා සංස්ථාවේ කිසිදු අධිසාමාජිකයෙකු විසින් කවර අන්දමේ වුවද, සම්මාදමක් කිරීමට යටත් නොවේ.

**සංස්ථාව විසුරුවා හැරීමෙන් පසු ණය තුරුස් ගෙවීමෙන් ඉක්බිති ඉතුරුවන සංස්ථාවේ දේපල නියාදනය කිරීම.**

9. සංස්ථාව විසුරුවා හැරීමෙන් ඉක්බිති සියලු ණය සහ බැරකම් ගෙවා නිදහස් කිරීමෙන් පසු මුදල් ඇතුලුව යම් දේපලක් ඉතුරුවී ඇත්තේ නම් ඒ දේපල, නම් කරනු ලබන සමිතියක් වෙත හෝ මහා භාරකාරවරයා වෙත පැවරිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථ වලට සමාන පරමාර්ථ සඳහා එය යෙදවිය යුතුය.

**ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.**

10. මේ පණතේ සඳහන් තැනැත්තන්ගේ හෝ ඔවුන් මගින් ඔවුන් වෙනුවෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පතන තැනැත්තන්ගේ අයිතිවාසිකම් වලට හැර ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තෙකුගේ අයිතිවාසිකම් වලට මේ පනතේ ඇතුලත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේය.

### උපලේඛනය 2 වන වගන්තිය

(1) ආචාර්ය ඩී. වී. ඩබ්ලිව්. අබේගුණවර්ධන මහතා

(2) ආචාර්ය අර්නස්ට් අබේරත්න මහතා

(3) ආචාර්ය බී. ඒ. අබේවික්‍රම මහතා

(4) මහාචාර්ය එස්. එන්. අර්සකුලරත්න මහතා

(5) මහාචාර්ය ඩැප්නි ආටිගල මහත්මිය

(6) මහාචාර්ය අයි. බාලසූරිය මහතා

(7) මහාචාර්ය එච්. එච්. කොස්තා මහතා

(8) මහාචාර්ය හිලරි කෲස් මහතා

(9) මහාචාර්ය සී. දසනායක මහතා

(10) මහාචාර්ය ආර්. එන්. ද පොන්සේකා මහතා

(11) ආචාර්ය එල්. බී. ද සිල්වා මහතා

(12) ආචාර්ය ආර්. එල්. ද සිල්වා මහතා

(13) ඒ. ඩී. එන්. ප්‍රනාන්දු මහතා

(14) ආචාර්ය එච්. ආර්. ප්‍රනාන්දු මහතා

(15) එල්. ජේ. ඩී. ප්‍රනාන්දු මහතා

(16) මහාචාර්ය පී. සී. බී. ප්‍රනාන්දු මහතා

(17) ආචාර්ය එස්. ඥානලිංගම් මහතා

(18) ආචාර්ය එච්. සී. පී. එන්. ගුණවර්ධන මහතා

(19) ආචාර්ය ජී. සී. එන්. ජයසූරිය මහතා

(20) වෛද්‍යාචාර්ය ආර්. පී. ජයවර්ධන මහතා

(21) ටී. ටී. ජෙයරාජ් මහතා

(22) ආචාර්ය එෆ්. එස්. සී. පී. කල්පගේ මහතා

(23) ආචාර්ය එම්. එල්. ටී. කන්නන්ගර මහතා

(24) මහාචාර්ය එස්. ආර්. කොට්ටේගොඩ මහතා

(25) ආචාර්ය ඒ. එන්. එස්. කුලසිංහ මහතා

(26) ආචාර්ය සී. ද එස්. කුලසිරි මහතා

(27) ආචාර්ය ජී. එස්. කුනසිංහම් මහතා

(28) මහාචාර්ය ඒ. ඩබ්ලිව්. මයිල්වාගනම් මහතා

(29) වෛද්‍යාචාර්ය එන්. නාගරත්නම් මහතා

(30) ආචාර්ය ඩබ්ලිව්. ආර්. එන්. නැතානියල් මහතා

(31) ආචාර්ය සී. ආර්. පානබොක්කෙ මහතා

(32) ආචාර්ය ආර්. ජී. පානබොක්කෙ මහතා

(33) ඩී. ටී. පච්චිආරච්චි මහතා

(34) මහාචාර්ය මිල්රෝයි ඒ. පෝල් මහතා

(35) මහාචාර්ය ඊ. ඕ. ඊ. පෙරෙයිරා මහතා

(36) මහාචාර්ය කේ. කේ. වයි. ඩබ්ලිව්. පෙරේරා මහතා

(37) ආචාර්ය ජේ. ඩබ්ලිව්. එල්. පීරිස් මහතා

(38) ආචාර්ය ඕ. එස්. පීරිස් මහතා

(39) ආචාර්ය රැල්ෆ් පීරිස් මහතා

(40) මහාචාර්ය ආර්. එස්. රාමක්‍රිෂ්ණ මහතා

(41) පී. යූ. රත්නතුංග මහතා

(42) ආචාර්ය ජස්ටින් සමරසේකර මහතා

(43) මහාචාර්ය කේ. එන්. සෙනෙවිරත්න මහතා

(44) ආචාර්ය එස්. ෂෙන්දිෂන්මුගනාදන් මහතා

(45) මහාචාර්ය ඩී. පී. ජී. එල්. සිරිවර්ධන මහතා

(46) මහාචාර්ය එම්. යූ. එස්. සුල්තාන් බාවා මහතා

(47) මහාචාර්ය ජී. ජී. ආර්. තම්බියාපිල්ලේ මහතා

(48) ආචාර්ය ඒ. තුරෙයිරාජා මහතා

(49) ආචාර්ය ඒ. ඩී. ජේ. වීරකෝන් මහතා

(50) ආචාර්ය ආර්. එල්. වික්‍රමසිංහ මහතා

(51) පණ්ඩිත ආචාර්ය එන්. ඩී. විජේසේකර මහතා

(52) ආචාර්ය ආර්. ඩී. ජී. විජේසේකර මහතා

(53) මහාචාර්ය එස්. විජේසුන්දර මහතා

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත් වල සහ පනත් වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 177 කි. (විදේශීය) රු. 236 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම **දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.**